තේමාව - ජලය

විෂය - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

පන්තිය - 6 ශ්‍රේණිය

පාඩම – පරිගණක පද්ධති විවිධ ක්ෂේත්‍ර තුල යොදාගෙන ඇති ආකාරය

අරමුණ – පරිගණකයේ භූමිකා පිළිබඳ අවබෝධය

01 පෙර ඉගෙනුම

- අතීත කාලයේ දී ගොවිපලවල් වලට ජලය ලබාදුන් ආකාරය පිළිබඳව කරුණු සොයන්න
- වර්තමානයේ දී ගොවිපලවල් වලට ජලය ලබා දෙන ආකාරය පිළිබඳව කරුණු සොයා බලන්න .
- නවීන තාක්ෂණය භාවිතයෙන් ඉතා පහසුවෙන් ගොවිපලවල් සඳහා ජලය ලබා දිය හැකි ආකාර පිළිබඳව කරුණු සොයා බලන්න

02 පන්ති කාමර ඉගෙනුම

1 කණ්ඩායම් තුනකට බෙදී එක් කණ්ඩායමකට අතීත කාලයේ දී ගොවිපලවල් සඳහා ජලය ලබා දුන් ආකාරයත් තවත් කණ්ඩායමකට වර්තමානයේ දී ගොවිපලවල් සඳහා ජලය ලබා දෙන ආකාරයත් තවත් කණ්ඩායමකට නවීන තාක්ෂණය යොදා ගෙන ජලය ලබා දිය හැකි ආකාරය පිළිබඳවත් කරුණු සාකච්ඡා කර විස්තර කරන්න .

2 නවීන තාක්ෂණය යොදා ගැනීමෙන් ජලය සැපයීම මගින් අඩු කාලයක දී අපට ගොවිපලට අවශ්‍ය ජල අවශ්‍යතාව සම්පූර්ණ කළ හැකි බව පිළිබඳව සාකච්ඡා කරන්න .

3 ගුරුවරයා අවශ්‍ය පරිදි මැදිහත් වෙමින් නවීන තාක්ෂණය භාවිතා කළ හැකි ආකාරය පිළිබඳව ළමුන්ට තොරතුරු ලබා දෙයි .

4 ගොවිපොළවල් සඳහා ජලය ලබා දීමේදී නවීන තාක්ෂණය ශ්‍රී ලංකාව තුළ භාවිතා කළ හැකි ආකාරය පිළිබඳව සාකච්ඡා කරයි .

03 පසු ඉගෙනුම්

1 පන්තිය

- ලංකාවේ විවිධ ප්‍රදේශවල පවතින භූ විෂමතා ලක්ෂණ අනුව නවීන තාක්ෂණය යොදා ගැන ජලය ලබා දිය හැකි ආකාර පිළිබඳ ලැයිස්තුවක් සකස් කරයි .

2 කණ්ඩායම් ක්‍රියාකාරකම

- ගොවිපලවල් වලට නවීන තාක්ෂණයෙන් ජලය ලබා දිය හැකි ආකාරය පිළිබඳව වර්ණවත් පෝස්ටරයක් සකස් කරයි .

3 කණ්ඩායම් ක්‍රියාකාරකම

- නවීන තාක්ෂණය යොදා ගෙන ජලය සැපයීම නිෂ්පාදන පිරිවැය අඩු වීමට බලපාන ආකාරය පිළිබඳව ලියා දක්වයි

4 කේවල

- තමා ජීවත්වන ප්‍රදේශයට ගැලපෙන පරිදි සාම්ප්‍රදායික ජල සැපයීමට වඩා නවීන තාක්ෂණික ජල සැපයුම් ක්‍රම යොදාගත හැකි ආකාර පිළිබඳව ලියා දක්වයි .

- තමා විසින් ලියන ලද කරුණු දෙමාපියන්ගේ වෙනත් අයගේ උදව් ලබා ගනිමින් නිවැරදිතාවය පරීක්ෂාකර ගුරුතුමියට ඉදිරිපත් කරයි .
- ශ්‍රී ලංකාව තුළ නවීන තාක්ෂණික ජල ක්‍රම යොදාගෙන ඇති ආකාරය පිළිබඳව විමසා බලන්න .

5 පොදු

- තමාට ආසන්නතම ගොවිපලක් නැරඹීමට යයි
- එහිදී ජලය සැපයීමට යොදාගෙන ඇති ක්‍රම පිළිබඳව අධ්‍යයනය කරයි.
- නවීන තාක්ෂණයෙන් ජලය සපයන ආකාර පිළිබඳ රූප එකතුවක් සකස් කරයි .

6 පාඩම ඉගෙනීම සඳහා අවශ්‍ය සහාය ලබාගත හැකි මුද්‍රිත ශ්‍රව්‍ය දෘශ්‍ය online මාධ්‍යය ( web පිටු හා සබඳතා )

- https://www.cbsl.gov.lk
- https://www.gwp.org
- https://lankaepress.com 2020/11/24
- https://www.agrimin.gov.lk
- හරිත TV රූපවාහිනී නාලිකාව
- රිවිදින අරුණැල්ල ජාතික රූපවාහිනී වැඩ සටහන
- නව කෘෂි තාක්ෂණය සහ කෘෂි වෙළඳපල face book group
- කමත face book group